# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1720/8 – 2011 අගෝස්තු 24 වැනි බදාදා – 2011.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: තිප්‍රාලේ 1/8/3/33 අත්.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2006/එච්ඩබ්/224.

2011 අප්‍රේල් 6 වන දින අංක 1700/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි සඳහන් මු.පි.කො. 9126 ට අයත් ඉඩමෙහි අත්පත් කරගනු ලබන කැබලි අංක 10862, 10863, 10866, 10867, 10868, 10869, 10872, 10873 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

ඩබ්ලිව්. පී. සන්දනායක,
ප්‍රාදේශීය ලේකම්,
තිඹිරිගස්යාය.

2011 ජූලි මස 29 වැනි දින,
තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

09 - 226

---

### ශුද්ධි පත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: දෙහි/ඉඩම්/1/2/28-(ii).

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010 දෙසැම්බර් 27 වැනි සඳුදා අංක 1686/10 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* (III) වැනි කොටස ඉඩම් යටතේ ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීමේ 1A හා 2A පිටුවල පලකර ඇති කෑගල්ල දිස්ත්‍රික්කයේ දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ දෙවැනි පිටුවේ දැක්වෙන හිමිකම් පරීක්ෂණ දිනයන් සහ අංක 1704/12 හා 2011.05.04 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* (III) වැනි කොටස ඉඩම් යටතේ 7 වන වගන්තිය යටතේ දැන්වීමේ සංශෝධිත දැන්වීමේ දැක්වෙන දිනයන් පහත සඳහන් පරිදි නැවත සංශෝධනය විය යුතු බව අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙත මෙයින් දන්වමි.

මෙම ඉඩම සඳහා අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තමතමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2011 නොවැම්බර් මස 9 වැනි දින ප.ව 1.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 ඔක්තෝබර් මස 28 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම අත්කර ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ටී. ආර්. නාලිකා පියසේන,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2011 අගෝස්තු මස 22 වැනි දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

09 - 232



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.